**ශීර්ෂය 316 - වයඹ පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2019 වර්ෂය**

---

## 1 දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

සෞභාග්‍යමත් වයඹ ජනතාවක්

### 1.2 මෙහෙවර

වයඹ ජනතාවගේ ජීවන තත්වය සුඛිත මුදිත කිරීමට හැකිවන පරිදි මානව, භෞතික හා මූල්‍ය සම්පත් ඵල ප්‍රයෝජනයක් සහිත කාර්යයන්හි යෙදවීම සඳහා පරිපාලනයට නායකත්වය දීම.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම.

## 2. විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

වයඹ පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 28,448.5 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 26,770.5 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,678 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.9 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2019 දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 25,212.5 | 25,212.5 | - | - |
| මූලධන | 3,236.0 | 1,558.0 | 1,678.0 | 52 |

| | | | | |
|---|---|---|---|---|
| එකතුව | 28,448.5 | 26,770.5 | 1,678.0 | 5.9 |
| | =========== | ============ | =========== | |

**3. විගණන නිරීක්ෂණ**

--------------------

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.